


**ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා පළපුරුදු වෘත්තීයමය පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# ප්‍රධාන කළමනාකරු - තොරතුරු පද්ධති විගණන

## 1. මූලික සුදුසුකම්

- තොරතුරු පද්ධති විගණනය (IS Auditing) පිළිබඳ අවම වසර 08ක පළපුරුද්දක් තිබීම. (බැංකු/ මූල්‍ය ක්ෂේත්‍රයේ නම් වඩාත් සුදුසු වේ)
- IT ක්ෂේත්‍රයෙහි පාරිභාෂික ශබ්ද මාලාව, සංකල්පයන් සහ පරිචයන් ආශ්‍රයෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පුහුණු අත්පොත් සංවර්ධනය සහ තොරතුරු පද්ධති විගණනය කිරීම සම්බන්ධ පළපුරුද්ද ඇතුළුව අවම වසර 03 ක සුපරීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් තිබීම.
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් තොරතුරු තාක්ෂණ හෝ එම ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.
- CISA හෝ CISM වෘත්තීය සහතිකය ලබා තිබීම අත්‍යවශ්‍ය වන අතර CCNA සුදුසුකම විකල්ප වශයෙන් තිබිය හැක.
- Scripting language පිළිබඳ අත්දැකීම් තිබීම වාසි සහගත වේ.
- ලිඛිත සහ වාචික සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ කුසලතා සහිත වීම. ඉදිරිපත් කිරීමේ හැකියාව සහිත වීම.
- තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ක්‍රියාවලින්/ තොරතුරු පද්ධති සහ තොරතුරු ආරක්ෂණ පාලනය පිළිබඳ මනා දැනුම
- මනා කළමනාකරණ කුසලතාව සහ සහයෝගයෙන් වැඩ කිරීමේ හැකියාව
- වයස අවු. 50ට අඩු වීම සුදුසුය.

## 2. වැටුප් පරිමාව

තෝරාගනු ලබන අයදුම්කරු බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

## 3. අයදුම් කළ යුතු ආකාරය

තමා පිළිබඳව විමසිය හැකි ඥතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිතව තම ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2022 නොවැම්බර් 11 දින හෝ ඊට පෙර careers@rdb.lk ඊමේල් ලිපිනයට යොමු කරන්න. එහි විෂය (Subject) තීරයේ අයදුම්කරනු ලබන අදාළ තනතුර සඳහන් කරන්න.

තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවා ගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය. ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank
"BBB+" Negative ICRA Lanka

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 42 52 62 | www.rdb.lk |